# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

SPMC

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## නිල ඇඳුම් සැපයීම

අංක 11,සර් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන, යන ස්ථානයේ පිහිටි රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) විසින් පහත සඳහන් නිල ඇඳුම් සැපයීම සඳහා සැපයුම්කරුවන් ගෙන් මිළ ගණන් කැඳවනු ලැබේ.

01 අළු පැහැති දිග කලිසම

02 අළු පැහැති කමිසය

03 අළු පැහැති හිස්වැසුම

04 සුදු පැහැති කාන්තා දිග කලිසම

05 සුදු පැහැති කාන්තා කබාය

06 සුදු පැහැති ජම්පරය සමග අරාබි තොප්පිය

07 සුදු පැහැති කාන්තා බේකරි තොප්පිය

ටෙන්ඩර් ආකෘති පත්‍ර බාගත කර ගැනීම, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ www.spmc.gov.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් සිදුකර ගත හැකිය.

ලංසු බැඳුම්කරය වශයෙන් ආපසු ගෙවනු ලබන රු.40,000/= ක තැන්පතු මුදලක් රා.ඖ.නි.සංස්ථාවේ (SPMC) ගිණුම් අංශයට ගෙවා ලබා ගත් කුවිතාන්සිය, ලංසු අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය.

සාමාන්‍යයෙන් වර්ෂයකට අවශ්‍ය වන ඉහත සඳහන් අයිතමයන්ගේ මුළු ප්‍රමාණය 1400 පමන වන අතර එහි සමස්ත ඇස්තමේන්තු ගත වටිනාකම රු මිලියන 4 ත් 5 ත් අතර වේ. ආයතනයේ අවශ්‍යතාවය මත වසර පුරා සේවකයින් බඳවා ගැනීමේ දී හා දැනට සේවයේ නියුතු සේවකයන් විසින් නිල ඇඳුම් ඉල්ලුම් කිරීමේදී එම අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා විටින් විට මිම් ලබාගැනීම්, ඇණවුම් ලබා දීම් වර්ෂය පුරා සිදුවනු ඇත. නිල ඇඳුම් මැසීම සඳහා සේවකයන්ගේ මිම් ලබාගැනීමට SPMC ආයතනයට පැමිණිය යුතු අතර ඒ සඳහා ප්‍රවාහන පහසුකම් හෝ වෙනත් කිසිදු ගෙවීමක් ආයතනය විසින් සිදුකරනු නොලැබේ. එසේම මිම් ලබාගැනීමෙන් සති 3 කට පසු එම නිල ඇඳුම් මසා නිම කොට ආයතනය වෙත ලබාදිය යුතුය.

මුද්‍රා තබන ලද ටෙන්ඩර් 2025 **දෙසැම්බර් මස 23 දින පෙ.ව. 10.00 ට පෙර රත්මලාන, කඳවල වත්ත, සර් ජෝන් කොතලාවල මාවත, අංක 11, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති** වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කල යුතුය.

මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් (SPMC) ආයතනයේ දී **2025 දෙසැම්බර් මස 18** වන දින **පෙ.ව. 10.00** ට පැවැත් වීමට නියමිතය.

ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් ටෙන්ඩර් අංකය **(SPMC/P&P/UNI/II/J/2025 -2026** සඳහන් කල යුතුය.

මේ සම්බන්ධව වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක 011-2637574 හෝ 011-2636234 මගින් **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් හා ප්‍රසම්පාදන** අමතන්න.

සභාපති - **ප්‍රසම්පාදන කමිටුව**<br>
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,<br>
අංක 11, සර් ජෝන් කොතලාවල මාවත,<br>
කඳවල වත්ත, රත්මලාන.